

# මනමේ
## හැට වසරකට පෙර

**හැට වසරකට පෙර මනමේ නාටකය පළමු වරට රංග ගත වූදා ලයනල් වෙන්ඩ්ට් ශාලාවේ තිරය ඇරෙද්දී ප්‍රේක්ෂකයන් හමුවේ පළමු වරට පෙනී සිටියේ ඔහු ය**

**මේ මනමේ පිළිබඳව එහි පොතේගුරු ලෙස ඒ ඓතිහාසික අවස්ථාවට මුහුණ දීමේ භාග්‍යය ලත් ශ්‍යාමන් ජයසිංහ ගේ අතීතාවර්ජනයකි**



1956 නොවැම්බර් තුන්වනදින ඉතිහාස ගතවූ දිනයකි. ඒ මායාකාරී දිනයේ ලයනල් වෙන්ඩ්ට් වේදිකාව මත මනමේ බිහිවිය. එදා සිට අද දක්වා වසර හැටක් මනමේ තවමත් නොලඩවා වේදිකා ගත වෙයි. වසර හැටක්...(

මම එවකට විශ්ව විද්‍යාලයේ පළමු වසරේ සිසුවකු වූයෙමි. එදා වේදිකා පරීක්ෂණයකින් පසු මහාචාර්ය සරච්චන්ද්‍ර ශූරීන් මනමේ රංගනය සඳහා අප තෝරාගන්නා විට අප ඉතිහාසගතවන නිර්මාණයකට දායක වෙමින් සිටින බව අපි කිසිලෙසකින්වත් තේරුම් නොගෙන සිටියෙමු. අධ්‍යයන කටයුතු වල නිරතවන අතරදීම අප මනමේ පුහුණුවට ගියේ විනෝදයටය. ඊබට් සිල්වා සමාගමෙන් කුළියට ගත් මනමේ බස් රියෙන් නගරයෙන් නගරයට ගොස් අපි මනමේ රංග ගත කළේ දිනෙන් දින වර්ධනය වූ ප්‍රේක්ශකාගාරයකටය.

මන්මේ නාට්‍යයේ පොතේගුරු ලෙස මගේ රංගනය පිළිබිඳ මහාචාර්ය සරච්චන්ද්‍රයන් ලියූ මේ සටහන අදත් මා කියවන්නේ සංවේදීව ය.

**"ප්‍රසිද්ධ රංගනයේදී සිදු වූයේ ආස්චර්යයෙකි. අවිනිශ්චිතව තිබූ පොතේගුරු භූමිකාවේ ස්වරූපය ඔහු ප්‍රේක්ෂකයන් හමුවේ හඬා දැක්වූවා සේ විය. ඔහු කඩතුරාවෙන් මතුවී ආ හැම මොහොතෙහිම ප්‍රේක්ෂකයෝ මහත් කුතුහලයෙන්, කිසිදු හැලහොල්මනක් නැතුව තම විදහා ගත් දෑස් ඔහු වෙත රඳවා බලා හුන්හ....මනමේ නාට්‍යයෙන් බිහිවූ හැම නාඩගමකම පොතෙගුරුන්නන්සේගේ භූමිකාව රඟපෑ නළුවාට කළ හැකි වූයේ ශ්‍යාමන් ජයසිංහ අනුකරණය කිරීම පමණි.. "**

*පින් ඇති සරසවි වරමක් දෙන්නේ 1985*

මනමේ පිලිබිඳව රෙජී සිරිවර්ධන සිලෝන් ඩේලි නිව්ස් පුවත්පත්ට ලියූ විචාරය අදත් මා සතුව ඇත.

**"සිය ගායනයෙන් හා ප්‍රේක්ෂකාගාරය සමග මනා සබැඳියාවක් පවත්වාගෙන යාම වෙනුවෙන් ශ්‍යාමන් ජයසිංහට විශේෂ නමස්කාරයක් හිමි විය යුතුය"**

රාමනාදන් ශාලාවේ කොරිඩෝවේ සිටියදී මගේ සගයකු පළමු වතාවට මේ පුවත මට දැන්නුවත් ඒ අවස්ථාවේ මට එහි වැඩි වැදගත් කමක් නොවැටහුණි.

කීර්තිමත් ලේකකයක= වූ ලංකාදීප පුවත්පතේ කතුවරයාව සිටි ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මහතා එවැනිම අදහසක් සිංහලෙන් ලියා තිබුණි.

"පොතේගුරුගේ රංගනය දුටු ඔනෑම කෙනෙකු නැවත නැවත එය දකින්නට කැමති වනු ඇති බව නිසැකය."යි මානවසිංහ ඔහුගේ මනරම් " වගතුග" කොළමේ ලියා තිබුණි.

මනමේ පිළිබිඳ පැසසුම් සහගත ලිපි පුවත්පත් පිටුමත ගලා යමින් තිබුණි.

කුරුණෑගල තිබූ මනමේ දර්ශනයකින් අනතුරුව රැක්මණී දේවිය වේදිකාව මතට පැමිණ මට සුබ පැතුවේ "ඔබේ ගායනය මනරම්" යයි ප්‍රශංසා කරමින්ය. ලංකාවේ ගීත කෝකිලාවිය ගෙන් පැසසුමක්...( කොපමණ සතුටක් ද?

මනමේ මතකය මගේ සිතේ ඇති කරන්නේ නිහතමාණී සතුටකි. **ගම්පොළ පැවති දර්ශනයකින් පසුව තරුණියන් කීපදෙනෙක් වේදිකාව පසුපසට පැමිණ මා අතගා බැලුවේ මා සැබෑවක්දැයි සැක හැරගන්නටය. එයින් එකියක මා අත තිබූ එකම සමරුවද ඩැහැගෙන සැඟව ගියාය. කල්ඇතිව ලැබුණ අවස්ථාවක් මට මගහැරුණ හැටි. එසේ වුවද ඇගේ වාසගම මගේ මතකයේ සිටියේ කෙසේද? ඇගේ වාසගම මාගම්මන බව තවමත් මතක ය.**

**වර්තමාන සිංහල නාට්‍ය ඉතිහාසය විවර කළේ මනමේ නාටකයයි. ඒ ඓතිහාසික අවස්ථාවේ වේදිකාවේ තිර විවරවත්ම ප්‍රේක්ෂකයන් හමුවට පැමිණ මගේ හඬින් ප්‍රේක්ෂකාගාරය පුරවන්නට වාසනාව මට ලැබුණි. ඒ වන විට මගේ මව අප හැර ගොසින් ය. අනේ ඇය එදා ඒ අවස්ථාව දැක බලා ගන්නට සිටියා නම්.**

**දැන් මට ඉතිරිව ඇත්තේ මගේ උරුමය මගේ දරුවන්ටත් දරුවන්ගේ දරුවන්ටත් ලබාදීම පමණකි.**

**මා සමග එක වේදිකාව බෙදාගත් බෙන් සිරිමාන්න එඩ්මන්ඩ් විජේසිංහ ට්‍රිලීෂියා ගුණවර්ධණ වැනි දැවැන්තයන් අප හැර ගොසින් ය. මොන තරම් ප්‍රතාපවත් රංගධරයන් ද? ඔවුන් පිළිබඳ මතකයට මම ආචාර කරමි. ඔවුන් සේම මනමේ නාට්‍යය අර්ථපූර්ණ එකක් බවට පත් කළ ඉන්ද්‍රාණී විජේසිංහ ට්‍රික්සි මෙන්ඩිස් රම්‍යා තුම්පෙළ සෙ-ඊමරත්න එදිරිසිංහ වැනි අය පිළිබඳ මතකයද**



**සුන්දරය. චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ කිසි ලෙසකින්වත් අමතක කළ හැකිද? සංවිධායකව සිටි ආතර් සිල්වා තවමත් අප අතර සිටියදී විමල් නවගමුග අප හැරගොස්ය.**

**බිසවගේ චරිතයට පණ පෙවූ ආරම්භක නිළිය තවමත් අප අතර සිටින බව සමහර විට නෙවදන්නවා විය හැකිය. ඈ හේමමාලි ගුණසේකර (දැන් ගුණසිංහ). ඇගේ ප්‍රභල රංගනය මගේ සිතට ඇති කළ සතුටක තරම. දර්ශන වාර කීපයක් එක් වූ ඇය විවාහ වී කැනඩාවේ පදිංචියට ගියාය. එය කණගාටුවට කාරණයක් නොවේද?**

**මනමේ වේදිකාවට එන්නේ නිසි කලටය. ප්‍රභල පිටපතක් ඇතිවය. දක්ෂ රංගශිල්පීන් ශිල්පිණියක් රැසකගේ දායකත්වය ඇතිවය. අපූරු නාට්‍ය ශෛලියකින් පිරිපුන්වය. සියල්ල වාණිජත්වයට යට නොවූ ඒ කාලයේ අප මනමේ හා එක්ව සිටියේ හුදු මානසික සන්තුෂ්ඨිය සඳහාමය යන්න සඳහන් කර තබනු කැමැත්තෙමි.**

